# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
## ඇබෑර්තු

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්ද සමඟ **2023 ඔක්තෝබර් 13** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. තමන් අයදුම්කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේද ලබා ගත හැකිය.)

**1. පාර්ලිමේන්තු නිලධාරී (දෙමළ මාධ්‍යය)**

**1.1 වැටුප් පරිමාණය:-**
2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.34,605-9x660/ 3x755 - 42,810/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 78,000/- පමණ වේ).

**1.2 වයස් සීමාව:-**
අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අවුරුදු 45ක් වේ. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**1.3 අධ්‍යාපන සුදුසුකම්:-**

i.) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මගින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම;

සහ

ii.) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙමළ භාෂාව, ඉංග්‍රීසි/ඉංග්‍රීසි සාහිත්‍යය සහ ගණිතය යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 6කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

**1.4 බඳවා ගැනීමේ ක්‍රමය:-**
ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

***සටහන:-*** *තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත්වීමෙන් වසරක කාලයක් තුළ දමිළ භාෂාවෙන් සහ ඉංග්‍රීසි භාෂාවෙන් වදන් සැකසුම් (Word Processing) පරීක්ෂණයකින් සමත් විය යුතුය. මෙම පරීක්ෂණයේදී දමිළ භාෂාවෙන් විනාඩි 25ක් ඇතුළත වචන 150කින් යුත් ලේඛනයක් සහ ඉංග්‍රීසි භාෂාවෙන් විනාඩි 25ක් ඇතුළත වචන 250කින් යුත් ලේඛනයක් සකස් කිරීමේ හැකියාව තිබිය යුතුය.*

## 2. සහකාර පර්යේෂණ නිලධාරී

### 2.1 කාර්ය ස්වභාවය:-

- පර්යේෂණවලට අදාළ දත්ත, තොරතුරු එක්රැස් කිරීම සහ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.
- පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් පසුබිම් සටහන් සකස් කිරීම.
- පර්යේෂණ කටයුතුවලට අදාළ දත්ත පත්‍ර සහ සංඛ්‍යාලේඛන උපුටන සකස් කිරීම
- පර්යේෂණ පැවැත්වීම සඳහා පර්යේෂණ නිලධාරීන් හට සහාය වීම.
- පර්යේෂණ කටයුතු සඳහා විවිධ පර්යේෂණ ලේඛන අධ්‍යයනය කිරීම සහ ඒවායින් අදාළ තොරතුරු උපුටා ගැනීම.
- ජාතික සහ ජාත්‍යන්තර සංසද, ජර්නල, සඟරා සහ පුවත්පත්වලට පර්යේෂණ පත්‍රිකා සකස් කිරීමේදී පර්යේෂණ නිලධාරීන්ට සහාය වීම.

### 2.2 වැටුප් පරිමාණය:-

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය රු. 40,545- 12 x 755 – 49,605/= වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාල අවම ආරම්භක දල මාසික වැටුප රු. 87,000/- පමණ වේ.)

### 2.3 වයස් සීමාව:-

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

### 2.4 අධ්‍යාපන සුදුසුකම්:-

i.) ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, නීතිය, කළමනාකරණය, සංඛ්‍යාණය යන විෂයන්ගෙන් එකක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් විශේෂ උපාධියක් තිබීම;

සහ

ii.) සිංහල/දෙමළ, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් ඇතුළුව විෂයයන් 6කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය සමත්ව තිබීම.

### 2.5 පළපුරුද්ද:-

ඉහත සුදුසුකම් සපුරාලීමෙන් පසුව රජයේ/ පිළිගත් ආයතනයක පර්යේෂණ පිළිබඳ වසර තුනක පළපුරුද්ද සහිත වීම.

### 2.6 බඳවා ගැනීමේ ක්‍රමය:-

ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

## 3. සේවා නියමයන් හා කොන්දේසි:-

(i) මෙම තනතුරු ස්ථිරය. මෙම තනතුරුවලට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, අභ්‍යන්තර අයදුම්කරුවකු හෝ රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

**4.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය:-

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඇ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

**5.** රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

**6.** තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

**7.** අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**8.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
2023 සැප්තැම්බර් 25 වැනි දින.